00027

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

පෙර පාසල් අධ්‍යාපන උසස් සහතික පත්‍ර වැඩ සටහන - 2009

පූර්ව ළමාවිය සමායෝගි වීමේ ගැටළු - ESC 2221

කාලය - පැය තුනයි.

---

දිනය - 2009.09.13 වේලාව - පෙ.ව. 09.30- ප.ව. 12.30 දක්වා

---

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

01. "මූලික ඉගෙනුම් ක්‍රියාවලි ඔස්සේ පරිසරය මගින් චර්යාව හැඩගස්වනු ලබයි."

i. සමාජ ඉගෙනුම් වාදීන් විසින් විස්තර කරන ලද මූලික ඉගෙනුම් ක්‍රියාවලි 3 නම් කරන්න.
(ලකුණු 05)

ii. සුදුසු උදාහරණ දක්වමින් බාල ළමුන්ගේ චර්යා සමායෝගි කිරීම සඳහා ප්‍රබෝධක (S) සහ ප්‍රතිචාර (R) දායක වන්නේ කෙසේදැයි පෙන්වා දෙන්න.
(ලකුණු 10)

iii. පෙර පාසල් ළමයින් තුළ නිතර දක්නට ලැබෙන සමායෝගි නොවන චර්යාවක් තෝරා ගන්න. එම චර්යාව වෙනස් කිරීම සඳහා සුදුසු ක්‍රියාකාරකමක් යෝජනා කර එයට අදාල සියළු පියවර කෙටියෙන් විස්තර කරන්න.
(ලකුණු 10)

02. i. මුල් ළමාවියේ 'බැඳීම්' යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් විස්තර කරන්න.
(ලකුණු 05)

ii. ශ්‍රී ලාංකිය සංදර්භය තුළ හඳුනාගත හැකි මුල් ළමාවිය බැඳීම්වලට බාධා කරන සාධක 5 ක් දක්වන්න.
(ලකුණු 05)

iii. ළමයින්ගේ මනෝ-සමාජිය සමායෝගි බව කෙරෙහි මුල් කාලීන බැඳීම්වල වැදගත්කම විවිධ න්‍යායවාදීන් විසින් පැහැදිලි කරනු ලබන්නේ කෙසේදැයි විශ්ලේෂණය කරන්න.
(ලකුණු 15)

03. i. ඩයනා බෝම්රින්ඩ් විසින් හඳුන්වා දෙනු ලැබූ දෙමව්පියන් දරුවන් හදාවඩා ගන්නා ප්‍රධාන ක්‍රම කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 10)

ii. ළමයෙකුගේ පසුකාලීන සමායෝගි වීම කෙරෙහි ඉහත දක්වන ලද දරුවන් හදාවඩා ගන්නා ක්‍රම මගින් ඇති කළ හැකි ධනාත්මක හා සෘණාත්මක බලපෑම් අදාල උදාහරණ දක්වමින් විභාග කරන්න.
(ලකුණු 15)

04. i. සිග්මන් ෆ්‍රොයිඩ් සඳහන් කළ කෙනෙකුගේ චර්යාව හැඩ ගස්වන ප්‍රධාන බලවේග තුනෙහි අන්තර් ක්‍රියාව සුදුසු උදාහරණයක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. මුල් ළමා වියේදී පැන නැඟිය හැකි ධනාත්මක හා ඍණාත්මක සමාජ චර්යා පිළිබඳ එරික්සන් විසින් දක්වන ලද අදහස් සුදුසු උදාහරණ දෙමින් විවේචනාත්මකව විභාග කරන්න.

(ලකුණු 05)

iii. එරික්සන් විසින් දක්වන ලද සංවර්ධන අවධි මත පදනම් වෙමින් තම ළමයින්ගේ සමායෝගී නොවූ හැසිරීම් වළක්වාලීම සඳහා දෙමාපියන්ට අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග 5 ක් කෙටියෙන් දක්වන්න.

(ලකුණු 10)

05. i. බාල ළමයින්ගේ චර්යා හැඩගැස්වීමේ ප්‍රධාන ක්‍රම ශිල්ප මොනවා දැයි නම් කරන්න.

(ලකුණු 05)

ii. ඔබගේ පෙර පාසල් දරුවන්ගේ ආක්‍රමණශීලි චර්යා හැඩගැස්ම ඉලක්ක කරගත් එක දිනකට ගැලපෙන සමෝධානිත පාඩම් සැලැස්මක් සකස් කරන්න.

(ලකුණු 10)

iii. සුදුසු උදාහරණ දක්වමින් මුල් ළමාවියේ සමායෝගී චර්යා හැඩගැස්වීම (විකරණය) සඳහා සෙල්ලම දායක වන අයුරු විභාග කරන්න.

(ලකුණු 10)

06. පහත සඳහන් ඕනෑම මාතෘකා 2 ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. පෙර පාසල් ළමයින් තුළ ඉහවහ ගිය කේන්තිය අඩු කිරීම සඳහා ගුරුවරියට ගත හැකි පියවර

ii. සමාජශීලි චර්යා ඉගැන්වීම සඳහා සහෝදර සහෝදරියන්ගේ භූමිකාව

iii. අවධානය පිළිබඳ දුෂ්කරතා ඇති ළමුන්ගේ අවධානය දිනා ගැනීමට පංති කාමරයේදී ඔබ ගන්නා ක්‍රියාමාර්ග

(ලකුණු 25)

- හිමිකම් ඇවිරිණි. -

THE OPEN UNIVERSITY OF SRI LANKA

ADVANCED CERTIFICATE PROGRAMME IN PRE-SCHOOL EDUCATION

FINAL EXAMINATION – 2009

ESC 2221 – ADJUSTMENT PROBLEMS IN EARLY CHILDHOOD

DURATION : THREE (03) HOURS

| DATE : 13th September 2009 | TIME : 9.30 a.m. – 12.30 p.m. |
|---|---|

ANSWER FOUR QUESTIONS ONLY.

01. "Behaviour is shaped by the environment through basic processes of learning"

i. Name three basic processes of learning explained by social learning theorists.
(05 marks)

ii. Demonstrate how stimulus (S) and response(R) involve in modifying mal-adjusted behaviours in young children through an appropriate example.
(10 marks)

iii. Identify a mal-adjusted behaviour you frequently observe in pre-school children. Propose an activity to change that behaviour. Briefly describe all the steps relevant to this activity.
(10 marks)

02. i. Briefly describe state what is meant by "attachment" in the early childhood years.
(05 marks)

ii. State five (05) common factors that disturb "attachment" during early childhood years, that you have identified within the Sri Lankan context.
(05 marks)

iii. Analyse how different theorists explained the importance of early attachment on psycho-social adjustment in children.
(15 marks)

03. i. Briefly describe the main parental styles identified by Diana Baumrind.
(10 marks)

ii. Citing relevant examples, examine the positive and negative impact of the above mentioned parental styles on later psycho-social development of children.
(15 marks)

04. i. Using an appropriate example, explain the interaction of three (03) main forces explained by Freud in shaping one's behaviour.

(05 marks)

ii. Citing examples, critically examine the views of Eric Erickson on positive and negative behaviours that emerge during early childhood years.

(10 marks)

iii. Based on Erickson's developmental stages, briefly state five (05) actions that parents should follow to present maladjusted behaviours of their children.

(10 marks)

05. i. Name three main techniques of behaviour modifications in young children.

(05 marks)

ii. Design an integrated lesson plan for a day, focusing on modifying aggressive behaviours in your pre school children.

(10 marks)

iii. Citing examples, examine how 'play' involves in modifying adjustment problems in early childhood yours.

(10 marks)

06. Write short notes on two of the following.

i. Steps that a teacher can take to reduce "Temper tantrums" in pre school children.

ii. Role of the siblings in teaching pre-social behaviour in early childhood.

iii. Steps you can take to gain attention of children with attention difficulties.

(25 marks)

*- Copyrights reserved -*